# ශ්‍රී ලංකාවේ සරසවි සිසුන් සඳහා රජයේ ශුභසාධන වියදම්වල කාර්යක්ෂමතාවය

(කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින් )

ඩබ්ලිව්.එම්.කරුණාරත්න

# සාරාංශය

කැලණිය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශුභසාධනය උදෙසා රජය විසින් විශාල මුදල් ප්‍රමාණයක් වාර්ෂික ව වැය කළ ද එම සේවාවන් කළමනාකරණය කිරීමේ ක්‍රමවේදයන් තුළ මෙන් ම සැපයෙන සේවාවන් තුළ ද දැඩි අකාර්යක්ෂමභාවයක් පවතින බව පෙනේ. කළමනාකරණ ක්‍රමවේදයන් තුළ ප්‍රධාන වශයෙන් දැකිය හැකි දුර්වලතාවයක් වන්නේ නිසි සැලසුමකින් තොරව ඒවා ක්‍රියාත්මක වීමයි. මේ නිසා ම පරිපාලනමය ගැටලු රාශියක් එම ශුභසාධන සේවා අංශ තුළ දැකිය හැකිය. එම ගැටලුවලට පිළියම් වශයෙන් ගනු ලබන හදිසි තීරණ හා තාවකාලික විසඳුම් නිසා මූල්‍ය කළමනාකරණයට පවා බාධාකාරී අන්දමින් තව දුරටත් වැය ශීර්ෂයන් ඉහළ යාමේ ප්‍රවණතාවයක් පවතී.

ඇතැම් ශුභසාධන සේවාවන් අත්‍යවශ්‍ය ලෙස ම හිමි විය යුතු සිසුන්ට නො ලැබීමත් එම පහසුකම් අත්‍යවශ්‍ය නොවන ඇතැම් සිසුන්ට ලැබීමත් කළමනාකරණ හා පරිපාලන දුර්වලතාවයන් නිසා හටගත්තක් බව පෙනේ. මූල්‍යාධාර වැනි ශුභසාධන පහසුකම් සිසුන්ට ලබා දීම සඳහා පමණක් දරනු ලබන කළමනාකරණ හා පරිපාලන අධි පිරිවැය මෙම ක්‍රියාමාර්ගයන්හි දුර්වලතා තව දුරටත් තහවුරු කරයි.

විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශුභසාධන සේවාවන් තව දුරටත් පුළුල් කිරීමේ සහ ශුභසාධන නව ව්‍යාපෘති ආරම්භ කිරීමේ අවශ්‍යතාවයක් දැඩි ලෙස පවතින නමුත් ඒ සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන සපයා ගත නො හැකි වීම ශිෂ්‍ය ශුභසාධනය පුළුල් කිරීමේ ප්‍රධාන සීමාකාරී බාධකය වී ඇත. රජය මගින් සපයන සීමිත මුදල් ප්‍රමාණය ද කාර්යක්ෂම ලෙස භාවිතයට ගැනීමක් සිදු නො වන බව තහවුරු කෙරෙන එක් උදාහරණයක් වශයෙන් දැනට ක්‍රියාත්මක වන ශුභසාධන සේවාවන් තුළ පවත්නා නාස්තිය හා සම්පත් අපතේ යාම දැක්විය හැකිය.

විශ්වවිද්‍යාලයේ අනෙකුත් කටයුතුවල දී මෙන් ම ශිෂ්‍ය ශුභසාධනයේ දී ද යෙදවිය හැකි මූල්‍ය ප්‍රතිපාදන හා අනෙකුත් සම්පත් සීමාකාරී වීම මත විශ්වවිද්‍යාලය විසින් සකසා ගත් යම් යම් නිර්ණායකයන් මත අත්‍යවශ්‍යතාවයට ප්‍රමුඛත්වය දෙමින්, සිදු කළ යුතු ශුභසාධන සේවා සහ ඒවා හිමි විය යුතු සිසු පිරිස් වර්ගීකරණය කොට ශුභසාධන සේවා ක්‍රියාත්මක කරයි. මේ නිසා මෙය දැඩි සංකීර්ණ වූත් උභතෝකෝටික ගැටලු පාලන අධිකාරිය වෙත ජනනය කරන්නා වූත් ක්‍රියාවලියක් වී ඇත.

විශ්වවිද්‍යාලය විසින් දරනු ලබන සීමිත ශිෂ්‍ය ශුභසාධන පිරිවැයෙහි කාර්යක්ෂමතාව ය ඇගයීමක දී එහි ප්‍රධාන නිර්ණායකය විය යුත්තේ එම ශුභසාධන සේවා භුක්ති විඳින ශිෂ්‍ය පිරිස එම සේවා තුළින් තෘප්තිමත් භාවයකට පත්ව ඇති ද යන්න යි. මෙය ප්‍රායෝගික මෙන් ම මනෝ මූලික කරුණක් ද වන හෙයින් එක් එක් සිසුවාගේ තෘප්තිමත් භාවය පදනම් කොට ගොඩ නැගෙන සමස්ත උපයෝගීතාවය ඉහළ මට්ටමක පවතින්නේ නම් කාර්යක්ෂම හා ඵලදායී මට්ටමකට එම පිරිවැය යෙදවී ඇති බව සැලකිය හැකි ය. මේ සම්බන්ධයෙන් සිසුන්ගේත් ආචාර්යවරුන්ගේත් පරිපාලන නිලධාරීන්ගේත් සහභාගිත්වයෙන් සිදු කළ නියැදි සමීක්ෂණය තුළින් හෙළි වී ඇත්තේ කැලණිය විශ්වවිද්‍යාලය විසින් සිදු කරනු ලබන ශුභසාධන සේවාවන් ගේ කාර්යක්ෂමතාව ය හා ඵලදායකත්ව ය සම්බන්ධයෙන් සිසුන්ගෙන් වැඩි ප්‍රතිශතයක් අතෘප්තිමත් මට්ටමක පසුවන බව ය. සිසුන් වැඩි ප්‍රතිශතයක් විසින් දරන මෙම අදහස නියැදියට සහභාගි වූ විශ්වවිද්‍යාලයීය ආචාර්යවරුන් විසිනුත් පරිපාලන නිලධාරීන් විසිනුත් වැඩි දුරටත් තහවුරු කොට ඇත.

කැලණිය විශ්වවිද්‍යාලය
1 - JUL 2006